**ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 නොවැම්බර් 15 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,400,858.99 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,380,811.93 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 20,047.06 ක් හෙවත් සියයට 1.43 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 531,602.57 | 528,958.83 | 2,643.74 | 0.50 |
| මූලධන | 5,475.32 | 5,457.99 | 17.33 | 0.32 |
| ණය ආපසු ගෙවීම | 863,781.10 | 846,395.11 | 17,385.99 | 2.01 |
| **එකතුව** | **1,400,858.99** | **1,380,811.93** | **20,047.06** | **1.43** |

## 2.2 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 11 ක් සඳහා එකතුව රු.මිලියන 80,935.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර පසුව එම ඇස්තමේන්තුව රු.මිලියන 62,210.00 ක් දක්වා සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 40,760.17 ක ආදායම් රැස්කර තිබුණු අතර එම ආදායම් රැස්කිරීම සංශෝධිත ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 27.98 ක සිට සියයට 130.17 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් පැවතුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | | තථ්‍ය ආදායම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක ලෙස |
|---|---|---|---|---|---|
| | මුල් ඇස්තමේන්තුගත ආදායම | සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.99.00 | 15,000.00 | 18,800.00 | 9,342.85 | (9,457.15) | 49.70 |
| 20.03.01.00 | 110.00 | 110.00 | 143.19 | 33.19 | 130.17 |
| 20.03.02.99 | 9,000.00 | 5,500.00 | 4,710.48 | (789.52) | 85.69 |
| 30.01.01.00 | 30,000.00 | 15,000.00 | 6,013.86 | (8,986.14) | 40.09 |
| 20.06.02.00 | 300.00 | 350.00 | 97.93 | (252.07) | 27.98 |
| 20.02.02.99 | 1,500.00 | 1,400.00 | 953.55 | (446.45) | 68.11 |
| 20.02.02.01 | 6,725.00 | 3,850.00 | 3,544.81 | (305.19) | 52.71 |
| 20.06.04.00 | 14,300.00 | 14,000.00 | 12,960.81 | (1,039.19) | 92.58 |
| 20.03.03.02 | 1,500.00 | 1,000.00 | 962.02 | (37.98) | 96.20 |
| 20.02.01.99 | 300.00 | 200.00 | 95.09 | (104.91) | 47.55 |
| 20.05.99.00 | 2,200.00 | 2,000.00 | 1,935.58 | (64.42) | 96.78 |
| එකතුව | **80,935.00** | **62,210.00** | **40,760.17** | **(21,449.83)** | **65.52** |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 24901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.50 | 3.19 | 3.00 | 3.71 | 21.00 | 17.16 |

**2.4 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ අංක 7002/0000/00/0371/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.76,753 ක් වී තිබුණි.

**2.5 විගණන නිරීක්ෂණය**

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 6 කට අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනවලින් සියයට 22 ක සිට සියයට 34 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 ආදායම් ගිණුම**

දෙපාර්තමේන්තු ප්‍රධානියා වශයෙන් ආදායම් සංකේතාංක 11 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) 20.02.01.99 දරන - අනෙකුත් කල්බදු කුලී ආදායම් සංකේතය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2009 ජුනි 01 දින පෞද්ගලික සමාගම් දෙකක් අතර ඇති කර ගෙන තිබු වර්ෂ දෙකක කාලයක් සඳහා වූ බදු ගිවිසුම කල් ඉකුත් වී තිබුණු අතර සංශෝධිත බදු ගිවිසුමකට එළඹී නොතිබුණි. නමුත් අදාළ බදු කුලිය රු.525,000 සිට රු.485,000 දක්වා අඩු කරමින් 2014 ජුනි 01 දින සිට 2019 මැයි 31 දින දක්වා වර්ෂ පහක කාලයකට ගිවිසුම දීර්ඝ කරන බව ලිපියක් මගින් පමණක් දන්වා තිබුණි. තක්සේරු වාර්තා මගින් එම කුලිය අඩු කර තිබුණද අදාළ ඉඩමේ තක්සේරු වටිනාකම පමණක් සඳහන් වීම සහ අදාල ගිවිසුමේ ගොඩනැගිලිද ඇතුළත්ව තිබුණි.

(ii) 2003 පෙබරවාරි 07 දිනැති ශ්‍රී ලංකා රජය හා පෞද්ගලික සමාගමක් අතර වර්ෂ 35 ක කාලයකට එළඹ තිබු කල්බදු ගිවිසුමේ 2.3 වගන්තිය ප්‍රකාරව, බදු කුලිය අවුරුදු 05 කට වරක් ඇමරිකා එක්සත් ජනපදයේ පූර්ව අවුරුදු 05 ක සමුච්චිත උද්ධමන අනුපාතය පදනම් කර ගෙන ස්වයංක්‍රියව සංශෝධනය වන බව සඳහන්

වුවද එදින සිට 2016 අප්‍රේල් 30 දින වන විට වාර්ෂික කුලී වටිනාකම ඇමරිකානු ඩොලර් 1,000 ක ප්‍රමාණය නොවෙනස් වන අගයක පැවතුණි.

(iii) පෞද්ගලික සමාගමකට අදාළව ශ්‍රී ලංකා රජය හා ඇමෙරිකා එක්සත් ජනපද රජය අතර 1991 දෙසැම්බර් 09 දින සිට වර්ෂ 20 ක් සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. 2011 දෙසැම්බර් 10 දින වන විට එම ගිවිසුම කල් ඉකුත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් නිකුත් කළ විගණන විමසුමකට පිළිතුරු වශයෙන් අදාළ ආයතනය අඛණ්ඩව බදු කුලි ගෙවා තිබුණු බවත් නව ගිවිසුමකට එළඹීම සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් වෙතින් විමසා ඉදිරි කටයුතු සිදු කරන බව විගණනය වෙත දැණුම් දී තිබුණි.

(iv) 2012 නොවැම්බර් 26 දිනැති අංක 054/2012 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව, පෞද්ගලික සමාගමක් වෙත බදු දී තිබූ රු.මිලියන 7,000.00 ක් වටිනා ඉඩමේ බැදුම්කරයේ වටිනාකම 2015 වර්ෂයේ ගිණුම් ගත කර තිබුණත්, තාක්ෂණික ගැටලුවක් හේතුවෙන් එය අවලංගු කළ බවත්, 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට එය ගලපන බව විගණනය වෙත දන්වා තිබුණි.

(v) 2013 වර්ෂයේ සිට පෞද්ගලික ආයතනයකට ලබා දී තිබූ ගොඩනැගිල්ලේ බදු ගිවිසුම අවලංගු වී තිබුණත්, බදු දීමනාකරු විසින් තවදුරටත් එම ඉඩම උපයෝජනය කරනු ලබන බව කොළඹ ප්‍රාදේශිය ලේකම් විසින් දන්වා තිබුණි. මෙම ආදායම මධ්‍යම රජය සතු ආදායමක්ද නැතහොත් පළාත් සභා සතු ආදායමක්ද යන්න පිළිබඳව හා හිඟ ආදායම් අය කර ගැනිමට ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නීති කටයුතු දෙපාර්තමේන්තුවෙන් විමසා තිබුණි.

**(ආ) 20.02.02.01 - ආදායම් සංකේතාංකය - ණයදිම හා පොලිය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ආපසු අයකර නොගත් ණය පොලි අයකර ගැනීම සම්බන්ධව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii). ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයෙන් අයවිය යුතු රු.මිලියන 39,804.37 ක් 2015 දෙසැම්බර් 31 දින මාරු පත්‍රයක් මගින් හිමිකම් ප්‍රාග්ධනයට පරිවර්තනය කර තිබුණි. නමුත් 2015 මාර්තු 09 දිනැති අංක MOFP/PE/CEB/CM/2015 හා අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව, පොලිය ද ප්‍රාග්ධනයට පරිවර්තනය කළ යුතුව තිබුණි. නමුත් එම හිඟ පොලිය 2016 අප්‍රේල් 30 දින වන විටත් ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(iii). උප ණය ලෙස ආයතන 09 ක් වෙත ලබා දී තිබුණු ණය ශේෂ 14 ක් සඳහා 2015 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු රු.මිලියන 1,545.83 ක් වූ ණය පොලී ආදායම්ද රැස්කර ගැනීමට දෙපාර්තමේන්තුව 2016 අප්‍රේල් 30 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

**(ඇ) 20.02.02.99 දරන ආදායම් සංකේතය -පොලිය හා වෙනත් ආදායම්**

ඉහත සඳහන් ආදායම් සංකේතය සඳහා 2015 වර්ෂයේ රැස්කළ යුතු ආදායම ලෙස රු. මිලියන 1,500.00 ක් මුල් ඇස්තමේන්තුවේ දක්වා තිබුණත්, එය රු.මිලියන 1,400.00 ක් දක්වා සංශෝධිත ඇස්තමේන්තුවෙන් අඩු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 953.55 ක ආදායම් රැස්කර තිබුණි. එය සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 68.11 ක් වී තිබුණි.

(ඇ) **20.03.01.00 දරන ආදායම් සංකේතය - දෙපාර්තමේන්තුමය විකිණීම්**

2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව, ක්‍රමවත් වාර්තා තබා ගැනීම අත්‍යාවශ්‍ය බව සඳහන් වුවද, ඉහත සඳහන් ආදායම් ගිණුම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් මාසික ගිණුම් සාරාංශ පමණක් පිළියෙල කර තිබුණි. එම ගිණුම් සාරාංශයේ සඳහන් තොරතුරුවල නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා වෙනත් කිසිදු වාර්තාවක් හෝ ලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ආදායම් සංකේතයට අදාළව රු.මිලියන 66.99 ක ආදායමක් රැස් තිබුණු සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් එම ලේඛන හෝ පොත්පත් පවත්වා නොතිබුණි..

(ඉ) **20.03.02.99 ආදායම් සංකේතය - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම්**

ඉහත සඳහන් ආදායම් සංකේතයට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 වර්ෂය සඳහා මෙම ආදායම් සංකේතය යටතේ රු.මිලියන 9,000.00 ක් ඇස්තමේන්තු කර තිබුණි. පසුව එම ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 5,500.00 ක් දක්වා සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආදායම් සංකේතය යටතේ රු.මිලියන 4,710.48 ක ආදායම් රැස්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම මුල් ඇස්තමේන්තුව අනුව සියයට 52.34 ක්ද, සංශෝධිත ඇස්තමේන්තුව අනුව සියයට 85.65 ක් වී තිබුණි.

(ii) 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (ආ) ඡේදය ප්‍රකාරව හිඟහිටි ආදායම් තව තවත් එකතුවීම වැලැක්වීම සඳහා ක්ෂණික පියවර ගත යුතුව තිබුණද, ආදායම් ගිණුමේ 2012 හා 2013 වර්ෂවලට අදාළව එකතුව රු.1,289,429 ක් වූ හිඟහිටි ආදායම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ඊ) **20.03.99.00 ආදායම් සංකේතය - විකුණුම් හා ගාස්තු ( අනිකුත් ලැබීම්)**

ඉහත සඳහන් ආදායම් සංකේතයට අදාළව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 15,000.00 ක ආදායම් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණත්, එම ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 18,800.00 ක් දක්වා සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 9,342.85 ක ආදායමක් පමණක් රැස්කර තිබුණි. එය මුල් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 62.29 ක්ද, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අනුව සියයට 49.70 ක් වී තිබුණි. ආදායම් පුරෝකථනය කිරීමේදී නිවැරදි දත්තයන් උපයෝගී කර නොගෙන ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, තවදුරටත් අතාත්වික ලෙස මුල් ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි.

(උ) **20.05.99.00 ආදායම් සංකේතය -වර්තන පැවරීම් - ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම්**

ආදායම් ගිණුම යටතේ අදාළ ආයතන වෙත මුදල් ආපසු ගෙවීම සඳහා 1503 දරන වැය විෂයය යටතේ රු.මිලියන 550.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එම ප්‍රතිපාදනවලින් රු. මිලියන 40.55 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්වලට මාරු කර තිබුණි. ඒ අනුව එම වැය විෂය යටතේ ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 509.45 ක් දක්වා අඩු වී තිබුණි. ඉන් රු.මිලියන 346.11 ක් පමණක් අදාළ ආයතන වෙත ආපසු ගෙවා තිබුණි. එය

ජාතික ලොතරැයි මණ්ඩලයෙන් ලද රු.මිලියන 1,433.10 ක මුළු ආදායමෙන් සියයට 24.15 ක් පමණක් වී තිබුණි.

**(ඍ) 20.06.02.00 ආදායම් සංකේතාංකය - ප්‍රාග්ධන වත්කම් විකිණීම්**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). සමාලෝචිත වර්ෂය සඳහා මෙම ආදායම් සංකේතය යටතේ රු.මිලියන 300.00 ක ආදායම් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණත්, පසුව එම ඇස්තමේන්තුව රු.මිලියන 350.00 ක් දක්වා සංශෝධනය කර තිබුණි. 2015 වර්ෂයේදී රු.මිලියන 97.93 ක ආදායම් රැස්කර තිබුණි. එය මුල් ඇස්තමේන්තුව අනුව සියයට 32.64 ක් වී තිබුණු අතර, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අනුව සියයට 27.98 ක් වී තිබුණි.

(ii). 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, ලැබී තිබූ තොරතුරු අනුව, සිදු කළ නියැදි විගණන පරීක්ෂාවකදී ආයතන 09 ක් විසින් වාහන විකුණා ලැබී තිබුණු රු.මිලියන 124.97 ක ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(iii). ඉහත චක්‍රලේඛය ප්‍රකාරව, ලබා ගත් තොරතුරු අනුව, 2015 වර්ෂයේදී අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන 45 ක වාහන 2217 ක් අපහරණය කළ යුතු බවට හඳුනා ගෙන තිබුණද, එම වාහන අපහරණය කළ බවට තොරතුරු ආදායම් ගිණුමෙන් අනාවරණය වී නොතිබුණි.

**(එ) 20.06.04.00 - ආදායම් සංකේතාංකය -ණය ආපසු අයකර ගැනිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) Renewable Energy for Rural Economic Development Project (RERED) සඳහා සීමිත සමාගමක් වෙත ලබාදී තිබූ රු.මිලියන 1,332.99 ක ණය මුදලින් 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 633.39 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි.

(ii) 1993 මාර්තු 10 දින ආසියානු සංවර්ධන බැංකුවෙන් ADB 1204 (SRI) SF ගිවිසුමට අනුව ලබාගත් රු.මිලියන 276.75 ක ණය මුදල, මහ නගර සභා හා නගර සභා ව්‍යාපෘති සඳහා උප ණය ලෙස ලබාදීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබුණි. මෙම විදේශ ණය මුදල ආසියානු සංවර්ධන බැංකුවට වර්ෂ 2 ක සහන කාලයක් සහිතව අවුරුදු 22 කින් ගෙවා නිම කළ යුතු වුවද, ඉන් ලබාදී තිබූ උප ණය මුදලින් 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 276.75 ක් හිඟහිටව පැවතුණි.

(iii) බදුල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ ණය සංචරකය යටතේ ලබාදී තිබුණු ණය මත බදුල්ල දිස්ත්‍රික් ප්‍රජා ශක්ති සංවිධානයට ලබාදී තිබූ රු.මිලියන 7.75 ක ණය මුදලින් රු.මිලියන 5.82 ක ණය ශේෂයක් අයකර ගත යුතුව තිබුණි. එම ණය මුදල අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ලිපි මගින් අදාළ ආයතනය වෙත දන්වා යවා තිබුණද, 2016 අප්‍රේල් 30 දින වන විටත් එම ණය ශේෂය අයකර ගෙන නොතිබුණි.

(iv) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත ලබාදී තිබූ ණයවලින් 2015 දෙසැම්බර් 31 දින වන විට හිඟහිටි රු.මිලියන 766.83 ක ණය ශේෂවලින් කිසිදු

මුදලක් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි. නෙදර්ලන්තය හා ඕස්ට්‍රේලියාවෙන් ලබාගත් ඇමෙරිකානු ඩොලර් මිලියන 12.94 ක ණය මුදලින් කිරි ගවයින් මිලදී ගැනීම සඳහා මණ්ඩලය වෙත ණය ලබා දී තිබුණි. 2015 පෙබරවාරි 27 දින එම ණය මුදල් අයකර ගැනීම සඳහා පවත්වා තිබූ සාකච්ඡාවකදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් එම ණය ගෙවීමට එකඟ වි තිබුණි. නමුත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉහත කී හිඟ ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(v) ණය අංක 2013012 SL යටතේ ලබා ගෙන තිබූ ණය මුදලකින් මිල්කෝ ආයතනයේ කර්මාන්ත ශාලා නවීකරණය (1 කොටස ) වෙනුවෙන් අදියර 1 හා 2 යටතේ ලබා දී තිබූ ණය වලින් 2015 වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.මිලියන 350.68 ක් හා රු.මිලියන 309.31 ක් හිග ණය ලෙස ශේෂ පැවතුණි. ඊට අමතරව 2015 වර්ෂයේ දීද අදියර 2 සඳහා රු.මිලියන 387.61 ක මුදලක් මිල්කෝ සමාගමට ලබාදී තිබුණි. කෙසේ වුවද, මීට අදාළව යුරෝ මිලියන 33.4 ක මූල්‍ය අක්‍රමිකතාවයක් පිළිබඳ විමර්ශණයක් ද සිදු කෙරෙමින් පැවතුණු අතර මෙම ණය මුදල් 2016 අප්‍රේල් 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(vi) ආයතන 08 විසින් ලබා ගෙන තිබුණු ණය මුදල් 13 ක් සම්බන්ධයෙන් රු.මිලියන 1,941.47 ක හිඟහිටි ණය ශේෂ පැවැතුණි. මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාර අර්ධ වාර්ෂික හිඟහිටි ආදායම් වාර්තාවලට එම ණය ශේෂ ඇතුළත් කර නොතිබුණි.

**(ඒ) 30.01.01.00 ආදායම් සංකේතාංකය - විදේශීය ප්‍රදානයන්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). සමාලෝචිත වර්ෂයේදී රැස්කළ යුතු ආදායම ලෙස රු.මිලියන 35,000.00 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව පසුව රු.මිලියන 15,000.00 ක් ලෙස සංශෝධනය කර තිබුණි. වර්ෂය තුළ රැස් කර තිබුණු මුළු ආදායම රු.මිලියන 6,013.86 ක් වී තිබුණි. ඒ අනුව රැස්කළ ආදායම මුල් ඇස්තමේන්තුවෙන් සියයට 17.18 ක් වී තිබුණු අතර සංශෝධිත ඇස්තමේන්තුව අනුව සියයට 40.09 ක් වී තිබුණි.

(ii). 2015 අප්‍රේල් 08 දින එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) යටතේ නවීන ජෛව - බලශක්ති තාක්ෂණය හඳුන්වා දීමේ ව්‍යාපෘතිය සඳහා විදේශ ප්‍රදානයක් වශයෙන් ලැබී තිබූ රු.මිලියන 3.22 ක්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම හේතුවෙන් 2015 සැප්තැම්බර් 25 දින ප්‍රදානකරු වෙත ආපසු යවා තිබුණි. ප්‍රදාන ලෙස ලද තවත් ව්‍යාපෘති 5 ක අදාල රු.මිලියන 75.67 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රදානකරුවන් වෙත ආපසු යවා තිබුණි.

(iii). සමාලෝචිත වර්ෂය ආරම්භ වන විට ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.මිලියන 2,731.75 ක් පොදු තැන්පත් ගිණුම් 23 ක රඳවා ගෙන තිබුණු අතර එම මුදල් අදාළ අරමුණුවල නොයොදවා වර්ෂය අවසන් වන විටත් එසේම පැවතුණි.

(iv). රජයේ ප්‍රදාන වෙනුවෙන් පවත්වා තිබූ පැරණි තැන්පත් ගිණුම් 07 ක ගිණුම් ගත කිරීමේ දෝෂ හේතුවෙන් ඇති වී තිබූ එකතුව රු.මිලියන 30.69 ක් වූ හර ශේෂ නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සටහන් යොදා තිබුණු අතර එම අගය ආදායමෙන් ආපසු ගෙවීම් ලෙස ගිණුමේ දක්වා තිබුණි.

**3.3** **පොදු තැන්පත් ගිණුම**

-----------------------

දෙපාර්තමේන්තුව යටතේ ආරම්භ කරන ලද පොදු තැන්පත් ගිණුම් 358 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැන්පත් ගිණුම් 177 ක කිසිදු ශේෂයක් නොතිබුණි.

(ආ) 2014 හා 2015 යන වර්ෂ දෙකෙහිම ගනුදෙනු කිසිවක් සිදු නොවූ ආරම්භක ශේෂයන් පමණක් පැවති තැන්පත් ගිණුම් 05 ක් විය.

(ඇ) 2014 වර්ෂයේ සිට රු. මිලියන 35.12 ක හර ශේෂයක් පැවති තැන්පත් ගිණුමක එදින සිට ගනුදෙනු කිසිවක් සිදු කර නොතිබුණි..

**3.4** **කාර්යසාධනය**

---------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් අලෙවි කරනු ලබන විවිධ වර්ගයේ ලොතරැයි ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට ලද දායකය හා එමගින් විවිධ රජයේ ආයතන වෙත සහනාධාර ලබාදීම සිදු කර තිබුණි. 2015 සංශෝධිත අයවැය ඇස්තමේන්තු අනුව විවිධ රජයේ ආයතන වෙත සහනාධාර ලබා දීම සඳහා රු.මිලියන 534.75 ක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී වෙනත් වැය විෂයයන්ට රු.මිලියන 25.30 ක් මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 346.11 ක් එනම් සියයට 68 ක් පමණක් අදාළ ආයතන වෙත ලබාදී තිබුණි.

(ආ) රජයේ අග්‍රිම ගිණුම් ආරම්භ කිරීම සඳහා බලය දීම හා අධීක්ෂණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල එසේ ආරම්භ කළ අග්‍රිම ගිණුම් 191 ක රු.මිලියන 11,385.16 ක හර ශේෂ එකතුවක් හා රු.මිලියන 41.55 ක බැර ශේෂ එකතුවක් පියවීමකින් තොරව පැවතුණි. 2016 අගෝස්තු 31 දින වන විට ඉන් අග්‍රිම ගිණුම් 179 ක් පියවා තිබුණු අතර තවදුරටත් පියවා නොතිබුණු අග්‍රිම ගිණුම් ගණන 12 ක් විය. ඒවායේ ශුද්ධ හර ශේෂ වටිනාකම රු.මිලියන 870.40 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අයත් අග්‍රිම ගිණුමක හා අධිකරණ අමාත්‍යාංශයට අයත් අග්‍රිම ගිණුම් 02 ක 2016 සැප්තැම්බර් 30 දිනට පියවා නොතිබුණු අග්‍රිම ශේෂ පිළිවෙලින් රු.මිලියන 53.58 ක්, රු.මිලියන 253.47 ක් හා රු.මිලියන 302.00 ක් විය. මෙම වටිනාකම පොත්වලින් ඉවත් කිරීමට ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු බැවින් එම ශේෂ කපා හැරීමට නොහැකි වී තිබුණි. මේ සමබන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුව වෙත එවා තිබුණු ලිපියක් අනුව අග්‍රිම ශේෂයන් කපාහැරීම මඟින් රජයට කිසිදු අලාභයක් හෝ පාඩුවක් නොවන බවට කර ඇති තහවුරුව සම්බන්ධයෙන් සෑහීමට පත් විය නොහැකි බවත්, කිසියම් දිනෙක මෙම නොපියවූ ශේෂය හේතුවෙන් රජයට මූල්‍යමය පාඩුවක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් එය පියවීම සම්බන්ධයෙන් ක්‍රමවේදයන් හා ඊට සෘජු ලෙසම වගකිවයුතු නිලධාරීන්ගේ තොරතුරු ලබා දෙන ලෙස දන්වා එවා තිබුණි. ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් තොරතුරු ඉදිරිපත් කළ බව තහවුරු කෙරෙන කිසිදු සටහනක් විගණනයට ඉදිරිපත් කළ ගොනුවේ නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අංක 7002/0000/00/0071/0015/000 දරන අග්‍රිම ගිණුමේ රු.76,833,208 ක ශේෂයක් පියවා නොතිබුණි. 2016 වර්ෂයේදී රු.73,953,208 ක් පියවා තිබුණි. 2008 වර්ෂයේදී ටයිම්ස් ගොඩනැගිල්ලේ විදුලි සැපයීම සහා ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබූ ආරක්ෂක තැන්පතු මුදල වූ රු.2,880,000 ක් ද මෙම ශේෂය තුළ ඇතුළතව තිබුණි. එම ගොඩනැගිල්ල, මුදල් අමාත්‍යාංශයට අයත් වන බැවින් තැන්පතු මුදල අමාත්‍යාංශය වෙත පවරා ගන්නා මෙන් දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීමක් කර තිබුණද, 2016 අප්‍රේල් 30 දින වන විටත් ඊට අදාළ ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.

(iii) ජනාධිපති ලේකම් කාර්යාලයේ අංක 7002/0000/00/0117/0015/000 දරන අග්‍රිම ගිණුමේ රු.91,033,483 ක ශේෂයක් පැවති අතර විගණිත දිනය වන විටත් ඉන් රු.45,277,607 ක් පියවා නොතිබුණි. මෙම ශේෂය පැන නැගී ඇත්තේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ගිණුමෙන් සිදුකරන ලද ඍජු විදේශ ගෙවීමක් හේතුකොට ගෙන එම ශේෂය උද්ගත වී තිබුණු බව විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනුවේ සඳහන්ව තිබුණි.

(iv) විදේශ කටයුතු අමාත්‍යාංශයේ අංක 7002/0000/00/0035/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2013 වර්ෂයට අදාළව තවදුරටත් පියවා නොතිබුණු හර ශේෂය රු.233,526,090 ක් වී තිබුණි. එසේම, 2015 වර්ෂයට අදාළ නොපියවූ හර ශේෂය වූ රු.468,602,980 කින් තවදුරටත් පියවා නොතිබුණු බැර ශේෂය රු. 6,347,083 ක් විය. ඉහත 2013 වර්ෂයට අදාළ ශේෂය තුළ රු.49,602,783 ක හඳුනා නොගත් වෙනසක් පවතින බැවින් ඒ සඳහා අභ්‍යන්තර කමිටුවක් පත්කර එහි නිර්දේශ මත ඉදිරි පියවර ගැනීම සුදුසු බව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දක්වා තිබුණි.

(ඇ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2015 දෙසැම්බර් 31 දින වන විට රජයේ බැංකු ගිණුම් 2363 ක් වූ අතර දෙපාර්තමේන්තු තොරතුරු අනුව ඒ තුළ අක්‍රීය ගිණුම් 213 ක් පැවැතුණි. ලංකා බැංකුවේ තොරතුරුවලට අනුව අක්‍රීය ගිණුම් 284 ක් වී තිබුණි. ඉන් ගිණුම් 209 ක කිසිදු ශේෂයක් නොතිබුණු අතර ඉතිරි අක්‍රීය ගිණුම්වල 2015 ඔක්තෝබර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 7,593.83 ක් වී තිබුණි. අක්‍රීය ගිණුම් 11 ක ගනුදෙනු සිදු කර නොතිබුණු බැවින් හා අක්‍රීය ගිණුම් ලෙස සඳහන් එක් ගිණුමක අවසන්වරට ගනුදෙනු සිදු වූ දිනය සඳහන් කර නොතිබුණි. ඉතිරි අක්‍රීය ගිණුම් 272 හි කාල විශ්ලේෂණය වර්ෂ 1 ට අඩු කාලයක සිට හා වර්ෂ 8 ක සිට 9 ක් දක්වා කාල පරාසයක් වී තිබුණි. කෙසේ වුවද, 2016 පෙබරවාරි 11 දින වනවිට ලංකා බැංකුව යටතේ අක්‍රීය ගිණුම් 131 ක් පැවති අතර ඉන් ගිණුම් 127 ක් 2016 අප්‍රේල් 30 දින වන විට වසා දමා තිබුණි.

(ඈ) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ විධිවිධානවලට සහ අදාල පරිදි අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර ඇපකර නිකුත් කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එසේ ඇපකර 139 ක් නිකුත් කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා 3001 දරන වැය විෂයය යටතේ රු. මිලියන 400.00 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 134.64 ක ඇපකර නිදහස් කිරීම සඳහා ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). 2009 මාර්තු 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රජය සතු සමාගමක් වෙත නිකුත් කර තිබූ ඇ.ඩො. මිලියන 10.00 ක් වූ භාණ්ඩාගාර ඇපකරයේ කාලය අවස්ථා 7 කදී දීර්ඝ කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින දෙපාර්තමේන්තුව ණය මුදල හා පොලිය සඳහා රු. මිලියන 55.64 ක් බැංකුවට ගෙවීම් කර තිබුණි. 2012 ඔක්තෝබර් 01 දින හා 2013 මාර්තු 07 දිනවලදී පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ

කාරක සභාව විසින්, මෙම සමාගම තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොපවතින බැවින් ඈවර කිරීමට යෝජනා කර තිබුණි. සමාගමේ බැංකු ණය, සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව වෙත පවරමින් රු.මිලියන 50 ක වටිනාකමින් යුත් නව භාණ්ඩාගාර ඇපකරයක් නිකුත් කිරීමටත් එම ඇපකරය වර්ෂ 03 කින් සතොස ආයතනය මඟින් පියවීමටත් නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද, ඉහත ක්‍රියාවලිය ඉටු නොවීම මත භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මත මෙම ණය මුදල හා පොලිය දෙපාර්තමේන්තුව විසින් පියවා ඇති බව විගණනයට දන්වා තිබුණි.

(ii). පෞද්ගලික සමූපකාර සමිති සංගමයක් වෙත 2006 ජූලි 21 දින සීනි ඇතුළු අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමට නිකුත් කළ රු.මිලියන 50.00 ක භාණ්ඩාගාර ඇපකරයේ වලංගු කාලය 16 වතාවක් දීර්ඝ කර තිබුණි. 2015 දෙසැම්බර් 28 දින දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 79.00 ක් බැංකුව වෙත ගෙවා තිබූ අතර ඉන් රු. මිලියන 45.00 ක් ණය මුදල හා ඉතිරිය පොලිය වී තිබුණි. මෙම ඇපකරය නිකුත් කිරීම සඳහා ලබා ගත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් හෝ අමාත්‍ය මණ්ඩල තීරණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම මුදල පියවීමට එම සංගමය ක්‍රියා මාර්ගයක් ගෙන තිබූ බව ලිපිගොනුවේ සඳහන්ව නොතිබුණි. මීට අදාළව 2011 නොවැම්බර් මාසයේ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ණය ආපසු නොගෙවීමට ප්‍රධානතම හේතුව වන්නේ සමූපකාර සමිතිවල දුර්වල කළමනාකාරීත්වය වන බව හා සම්පූර්ණ මුදලින් සියයට 50 ක් පියවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අදියර ගත කර ලබාදීම, සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය විසින් රාජ්‍ය බැංකුවක් සමඟ සාකච්ඡා කර යම් ප්‍රතිශතයක් කපා හැරීමට කටයුතු කිරීම හා ණය මුදල් නියමිත පරිදි ආපසු නොගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් ණය යම් ප්‍රතිශතයක් අය කිරීමත් නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද, භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මත මෙම ණය මුදල හා පොලිය දෙපාර්තමේන්තුව විසින් පියවා තිබුණු බව විගණනයට දන්වා තිබුණි.

(iii). 2010 ජූලි 28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය අනුව නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සඳහා ගල් අඟුරු ආනයනය කිරීම වෙනුවෙන් ණයවර ලිපියක් නිකුත් කිරීමට රු.බිලියන 1.00 ක භාණ්ඩාගාර ඇපකරයක් නිකුත් කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. නමුත් 2013 වර්ෂය වන විට රු.බිලියන 2.00 ක් සඳහා ඇපකර නිකුත් කර තිබුණි. එය 2014 වර්ෂය වන විට රු. බිලියන 3.00 ක් දක්වා වැඩිකර තිබුණු අතර 2014 වර්ෂය අවසාන වන විට එම ඇපකර සියල්ල අවලංගු කරමින් රු.බිලියන 5.00 ක නව භාණ්ඩාගාර ඇපකරයක් නිකුත් කර තිබුණි. එම ඇපකරයේ වලංගු කාලය 2015 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වන විට එය රු. බිලියන 6.00 දක්වා වැඩි කර තිබුණි.

(iv). 2005 පෙබරවාරි 02 දින සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව වෙත රු.මිලියන 207.1 කට නිකුත් කළ භාණ්ඩාගාර ඇපකරයේ කාලය වරින්වර දීර්ඝ කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් 2013 මාර්තු 01 දින ඉන් රු.මිලියන 50.00 ක් ගෙවා ඉතිරි රු.මිලියන 157.1 වෙනුවෙන් භාණ්ඩාගාර ඇපකරය දීර්ඝ කිරීමක් සිදුකර තිබුණද, 2016 අප්‍රේල් 30 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

(v). ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත වරින් වර භාණ්ඩාගාර ඇපකර නිකුත් කර තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දින වන විට වලංගුව පැවති ඇපකරවල වටිනාකම රු. මිලියන 1,328.03 ක් විය. ලිපිගොනුව අනුව, මෙම ආයතනය වෙත ලබා දී ඇති ඇපකරවල වටිනාකම ප්‍රමාණවත් නොවන බවත්, රාජ්‍ය බැංකු දෙක සඳහා ඇ. එ. ඩො. මිලියන 1,000 බැගින් වූ ඇපකර නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලීම් කර තිබුණි. එසේ වුවද, පෙර වර්ෂවලදී ලබා දුන්

ඇපකරවල කාලය දීර්ඝ කිරීම හැර දීර්ඝ කාලයක සිට පැවත එන මෙම මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම හෝ ඉදිරි පියවර ගැනීම හෝ දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොතිබුණි. කෙසේ වුවද, භාණ්ඩාගාර ඇපකර මත සැපයූ මූල්‍ය පහසුකම් නිරවුල් කිරීම පිළිබඳව ඒ සම්බන්ධව අධීක්ෂණය හා නිර්දේශ ඉදිරිපත් කරනු ලබන ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සිදු කළ යුතු බව දෙපාර්තමේන්තුව විසින් විගණනයට දන්වා තිබුණි.

(vi). වී අලෙවි මණ්ඩලය වෙත බැංකු 02 කින් ලබා දී තිබූ ණය මුදල් සඳහා නිකුත් කර තිබූ භාණ්ඩාගාර ඇපකරවල වටිනාකම රු. මිලියන 6,377 ක් වූ අතර ඉතිරිය වූ රු.මිලියන 5,231.01 ක් නිරවුල් කර නොතිබුණි. එසේම එම ඇපකරවලට අමතරව භාණ්ඩාගාරය විසින්ද රු.මිලියන 2,000 ක් මණ්ඩලය වෙත ලබා දී තිබුණද දෙපාර්තමේන්තුව විසින් එම මුදල් පියවීමට අදාළව උපදෙස් හා ඉදිරි ක්‍රියාමාර්ග ලබා දීම සඳහා යොමු වී නොතිබුණි.

(ඉ) 2006 වර්ෂයේ අයවැය යෝජනා අනුව දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර තිබූ ගොවි ද්‍රව්‍ය මිලදී ගැනීම හා විකිණීම සඳහා චක්‍රීය අරමුදලේ කටයුතු 2016 මාර්තු 31 දින සිට අවසන් කර තිබුණි. 2015 වර්ෂයේදී අරමුදලින් ආයතනවලට මුදල් නිදහස් කිරීමක් කර නොතිබුණු අතර 2016 මාර්තු 30 දින නොපියවූ උප ණය ශේෂයට (On lending outstanding) අදාළ රු.මිලියන 1,999.03 ක් 20.06.04.00 දරන ආදායම් ගිණුමට හා මුදල් පොතේ ඉතිරි ශේෂය වූ රු. මිලියන 237.41 ක් 20.03.99.00 දරන ආදායම් ගිණුමට බැර කර අරමුදල අවසන් කර තිබුණි. මෙම අරමුදල චක්‍රීය අරමුදලක් බැවින් ඉහත පියවන ලද උපණය ශේෂය වූ රු. මිලියන 1,999.03 ක ශේෂයට අදාළ තොරතුරු වෙන් වෙන්ව හඳුනා ගැනීමකින් තොරව ආදායම් ගිණුමට මාරු කර ඉතිරි ශේෂය ආදායම් ගිණුමට මාරු කිරීම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියක් මත පමණක් සිදු කර තිබුණි. ඒ අනුව එදිනට අයවිය යුතු ශේෂය රු.මිලියන 2,236.43 ක් වී තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 20 | 01 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - | - |
| (iii) | ද්විතියික මට්ටම | 82 | 69 | 13 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 19 | - | - |
| | **එකතුව** | **122** | **109** | **14** | **01** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ශ්‍රී.ලං.ග.සේ. I පන්තියෙහි තනතුරු 07 ක් පැවතියද, සත්‍ය කාර්ය මණ්ඩලය 08 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණි. ඒ අනුව එක් තනතුරක අතිරික්තයක් අනාවරණය වී තිබුණත්, ඒ සඳහා විධිමත් අනුමැතියක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ලබා ගෙන නොතිබුණි.

(ආ) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් 2013 පෙබරවාරි 19 වන දින සිට වැඩ බැලීමේ පදනම මත ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරියෙකු මඟින් පුරවා තිබුණු බැවින් ඒ සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කිරීමට ක්‍රියාකර නොතිබුණි. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව එම තනතුරෙහි වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත් කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා ආවරණ අනුමැතිය හෝ ලබා නොගෙන වර්ෂ 3 1/2 කට අධික කාලයක් එම තනතුරේ වැඩ බැලීම අඛණ්ඩව සිදු කරමින් පැවතුණි.